000130

AL/2023(2024)/74/STE-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | | | |
|---|---|---|---|
| පාලි I<br>பாளி I<br>Pali I | 74 STE I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** නිවැරදිව ලියා ඇති පාලි ගාථා පාදය තෝරන්න.
(1) අත්තානං ධමයන්ති පණ්ඩිතා
(2) ඵලභිසඤ්ඤා සච්චිකතා
(3) නිවාතවුත්ති අත්ථද්ධො
(4) බමරස්සෙව ඉරියතො

**2.** පුල්ලිංග වාචක පදය සහිත වරණය කුමක් ද?
(1) උතුනියො
(2) මණ්ඩුකියො
(3) සාමිනො
(4) සිගාලිනො

**3.** '**තාවතිංසම්ගච්ඡහං**' යන්නෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.
(1) තාවතිංස + අගච්ඡි + අහං
(2) තාවතිංසං + ගච්ඡි + අහං
(3) තාවතිංස + ගච්ඡං + අහං
(4) තාවතිංසං + අගච්ඡිං + අහං

**4.** සමාන ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් පද සහිත වරණය තෝරන්න.
(1) අට්ඨ, තුට්ඨ, දිට්ඨ, හට්ඨ
(2) එත්තාවතා, කිර, මුහුත්තං, සම්මා
(3) තාවදෙව, ඛධානකීළං, සගුණං, නෙත්තාරං
(4) පහාය, පසාදාය, මූලාය, විහාය

**5.** '**අර්ධමාගධී**' යන්නට පර්යාය නාමයක් වන්නේ පහත ඒවායින් කවරක් ද?
(1) ආර්ෂමාගධී
(2) දේශීය මාගධී
(3) පුරාණමාගධී
(4) ශුද්ධමාගධී

**6.** '**යථාපි රහදො ගම්භීරො**' යන්නෙන් ආරම්භ වන ගාථාවෙහි අවසන් පාදය මේවායින් කවරක් ද?
(1) අසතං හොති අප්පියො
(2) සෙය්‍යො හොති න පාපියො
(3) විප්පසීදන්ති පණ්ඩිතා
(4) සදා රමති පණ්ඩිතො

**7.** '**පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති**' යන්නෙහි **සාපතෙය්‍යං** යනු
(1) අඹුදරුවන් ය.
(2) කුල පරම්පරාව ය.
(3) දායාදය ය.
(4) සියලු වස්තුව ය.

**8.** රූපකාලංකාරයක් සහිත පාලි ගාථා පාදය තෝරන්න.
(1) අත්ථා අච්චෙන්ති මාණවෙ
(2) අන්ධානං නයනූපමො
(3) ජාතපල්ලවකොමලං
(4) නීහියරෙ කාළපක්ඛෙව චන්දො

**9.** දරුවන් කෙරෙහි මව්පියන්ගේ වගකීමක් ලෙස සිගාල සූත්‍රය දක්වන කරුණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ආපදාසු න විජහන්ති.
(2) කල්‍යාණෙ නිවෙසෙන්ති.
(3) අස්සුතං සාවෙන්ති.
(4) සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති.

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

Past Papers Wiki



10. විනය පිටකයට අනුව ගිනිහල් ගෙයක භාවිතයට ගැනෙන දෑ සඳහන් වන වරණය තෝරන්න.
(1) බෙලමල්ලකං, චොලකං, ජන්තාඝරපීඨං (2) චුණ්ණං, ජන්තාඝරපීඨං, මත්තිකා
(3) නිසීදනං, භුම්මත්ථරණං, පච්චත්ථරණං (4) පාදොදකං, පාදපීඨං, පාදකඨලිකං

11. පාලි භාෂාවෙන් රචිත පද්‍යමය ග්‍රන්ථයක් **නොවන්නේ** පහත ඒවායින් කවරක් ද?
(1) ජිනචරිත (2) ජිනවංසදීප
(3) සමන්තකූටවණ්ණනා (4) සහස්සවත්ථුප්පකරණ

12. **'න කාමකාමා ලපයන්ති සන්තො'** මෙහි **ලපයන්ති** යන්නට අරුත් වශයෙන් වඩාත් ආසන්න පාලි වචනය තෝරන්න.
(1) ජහන්ති (2) දස්සයන්ති
(3) රමෙන්ති (4) සල්ලපන්ති

13. **'කින්නු ඛො මහාරාජ, අතිප්පගොව ආගතොසි?'** මෙම ප්‍රකාශයෙහි අවස්ථා සම්බන්ධය නිවැරදිව ප්‍රකාශිත වරණය කුමක් ද?
(1) කොසොල් රජු විසින් සිහින දුටු දින උදෑසන මල්ලිකා දේවියට කියන ලද්දකි.
(2) බමුණන් විසින් සිහිනය දුටු දින සවස කොසොල් රජුට කියන ලද්දකි.
(3) කොසොල් රජු බුදුරදුන් හමුවීමට ගිය අවස්ථාවේ දී බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි.
(4) සිහින දුටු දින රාත්‍රියෙහි මල්ලිකා දේවිය විසින් කොසොල් රජුට කියන ලද්දකි.

14. **'අපස්සමානො ......... මං පස්සම්පි න පස්සති'** නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි මෙහි හිස්තැනට සුදුසු පදය තෝරන්න.
(1) ඛන්ධානං (2) නිබ්බානං (3) සත්තාහං (4) සද්ධම්මං

15. මුටසීව රජුගේ පියා,
(1) අභය නම් විය. (2) කාකවණ්ණතිස්ස නම් විය.
(3) ජෙට්ඨතිස්ස නම් විය. (4) පණ්ඩුකාභය නම් විය.

16. මහාවංසටීකාව රචනා කිරීමේ දී කතුවරයා මහාවංසයෙහි දක්නට **නොලැබෙන** විස්තර සපයා ගත් ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ,
(1) උත්තරවිහාරට්ඨකථාව ය. (2) කාම්බෝජමහාවංස ය.
(3) පද්‍යපද්‍යෝරුවංස ය. (4) මහාඅට්ඨකථාව ය.

17. පාලි ථූපවංසය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශයක් සඳහන් වන වරණය තෝරන්න.
(1) ස්තූප අතර රුවන්වැලි මහසෑයෙහි ප්‍රවෘත්තිය පමණක් දැක්වේ.
(2) ග්‍රන්ථය ආරම්භයෙහි බුද්ධචරිතය විස්තර වේ.
(3) පුරාණ ස්තූපවංශයක් ඇසුරෙන් රචනා කොට ඇත.
(4) කතුවරයා වාචිස්සර නම් තෙර නමකි.

18. විරුද්ධාර්ථවත් පද යුගලයක් වන වරණය තෝරන්න.
(1) අද්දස, නාද්දස (2) අමිත්ත, මිත්තපතිරූපක
(3) වණ්ණ, සුවණ්ණ (4) නික්කුජ්ජිත, අවකුජ්ජිත

19. **'තිස්සො විජ්ජා'** යන්නෙහි නිවැරදි සමාස පදය කුමක් ද?
(1) තිස්සවිජ්ජා (2) තෙවිජ්ජො
(3) තිවිජ්ජා (4) තිංසවිජ්ජො

20. දීඝනිකාය හා මජ්ඣිමනිකාය යන ග්‍රන්ථ දෙකෙහි ම දක්නට ලැබෙන සූත්‍රයක් වන්නේ,
(1) අසුත්තර ය. (2) ලක්ඛණ ය.
(3) සක්කපඤ්හ ය. (4) සතිපට්ඨාන ය.

21. කථාවත්ථුප්පකරණය බුද්ධභාෂිතයක් බව අවධාරණය කිරීමට අටුවාකරු දක්වන වැදගත් ම සාධකය පහත ඒවායින් කවරක් ද?
(1) ධර්ම විනය සංගායනා වන අවස්ථාවක රචනා වූ බව පැවසීම
(2) බුදුරදුන් විසින් දේශිත මාතෘකා අනුව එය සම්පාදනය කර ඇති බව පැවසීම
(3) මෙහි කර්තෘත්වය රහතන් වහන්සේ නමකට පැවරීම
(4) සතර මහා අපදේශයන්ට අනුගතව සකස් වී ඇති බව දැක්වීම



0006967

**22.** **ජූතප්පමාදට්ඨානානුයොගො** යන්නෙහි නිවැරදි පද බෙදීම දැක්වෙන වරණය කුමක් ද?
(1) ජූත + පමාද + ඨාන + අනුයොගො
(2) ජූත + අප්පමාද + ඨාන + අනුයොගො
(3) ජූත + පමා + දට්ඨානානු + යොගො
(4) ජූතප්පමාද + ඨාන + අනු + යොගො

**23.** අපදානපාළියට අනුව පදුමුත්තර බුදුරදුන් එනම් වූයේ,
(1) පියුමකට සමාන සවන් ඇති නිසා ය.
(2) පියුමක් මෙන් කාන්තිමත් වන නිසා ය.
(3) පියුම් මෙන් උදැසන විකසිත වන නිසා ය.
(4) පියුම් මෙන් සාරවත් වන නිසා ය.

**24.** දෙවනපෑතිස් රජුගේ දූත පිරිස දඹදිව රැඳී සිටි කාල පරිච්ඡේදය වන්නේ,
(1) දින හතකි.
(2) සති හතරකි.
(3) මාස පහකි.
(4) මාස හතකි.

**25.** '**අනොතත්තොදකං චෙව, ගංගාසලිලමෙව ච**' යන උද්ධෘත පාඨයෙහි දැක්වෙන අනෝතත්ත විල පිහිටියේ කොහි ද?
(1) ලක්දිව ය.
(2) පැළලුප්නුවර ය.
(3) හිමාලයේ ය.
(4) දෙව්ලොව ය.

**26.** අටුවාවට අනුව ජාතක කථාවක ආකෘතිය ප්‍රකාශ වන අංග පහ දැක්වෙන වරණය තෝරන්න.
(1) ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛන
(2) දෙසක, දෙසනා, නිදාන, කථාවත්ථු, සමොධාන
(3) පච්චුප්පන්නවත්ථු, අතීතවත්ථු, ගාථා, වෙය්‍යාකරණ, සමොධාන
(4) සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන

**27.** '**මජ්ඣෙඨ විසුද්ධිමග්ගො එස - චතුන්නම්පි ආගමානං හි**' යන්නෙහි **ආගමානං** යන්නෙන් අදහස් වන්නේ,
(1) බුද්ධාගම ය.
(2) මුල් නිකාය ග්‍රන්ථයන් ය.
(3) විසුද්ධිමග්ගයේ මැද භාගය ය.
(4) සිවු දෙනෙකුගේ පැමිණීම ය.

**28.** සත්ත්ව හිංසාව නොකොට යාග කළ යුතු ආකාරය දැක්වෙන සූත්‍රය කුමක් ද?
(1) අම්බට්ඨ
(2) කූටදන්ත
(3) බ්‍රහ්මජාල
(4) සොණදණ්ඩ

- පහත දැක්වෙන ගාථාව ඇසුරෙන් අසා ඇති අංක **29** සිට **32** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**උසභා රුක්ඛා ගාවියො ගවා ච, අස්සො කංසො සිගාලී ච කුම්භො,**

**පොක්ඛරණී ච අපාකචන්දනං, ලාපූනි සීදන්ති සිලා ප්ලවන්ති.**

**29.** ඉහත ගාථාවෙහි ඇතුළත් ස්ත්‍රීලිංගික පද ගණන කීය ද?
(1) දෙකයි
(2) තුනයි
(3) හතරයි
(4) පහයි

**30.** **කංස, කුම්භ, අපාක** යන පදවල අර්ථය පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
(1) කළය, තළිය, මල්ල
(2) රන්බඳුන, කළය, නොපැසුණු බත්
(3) රන්මසු, රන්බඳුන, හැළිය
(4) නොපැසුණු බත්, හැළිය, වංගෙඩිය

**31.** **පොක්ඛරණී** ශබ්දයේ ෂට්ඨී විභක්ති ඒකවචන පදය කුමක් ද?
(1) පොක්ඛරණියා
(2) පොක්ඛරණිනො
(3) පොක්ඛරණිස්ස
(4) පොක්ඛරණියං

**32.** **සීදන්ති** හා **ප්ලවන්ති** යන ක්‍රියා පදවල සත්තමී ආඛ්‍යාත පඨමපුරිස බහුවචන ක්‍රියාරූප දැක්වෙන වරණය තෝරන්න.
(1) සීදෙය්‍යාථ, ප්ලවෙය්‍යාථ
(2) සීදෙය්‍යුං, ප්ලවෙය්‍යුං
(3) සීදෙය්‍ය, ප්ලවෙය්‍ය
(4) සීදෙය්‍යාසි, ප්ලවෙය්‍යාසි

000130
03040000188110130

33. අතවැසි භික්ෂුවකගේ චීවරය අපවිත්‍ර වී ඇත්නම් ආචාර්ය භික්ෂුව විසින් එය
(1) අනෙකෙකු ලවා සේදවිය යුතුය. (2) ඉවත් කිරීමට උපදෙස් දිය යුතුය.
(3) තමා විසින් ම සෝදා දිය යුතුය. (4) මෙසේ සෝදන්න යැයි උත්සාහවත් කළ යුතුය.

34. මහාවංසයෙහි නිර්දිෂ්ට කොටස අනුව ස්වර්ණපාලි දේවිය
(1) දරුවන් දස දෙනෙකුගේ මවකි. (2) දෙවනපෑතිස් රජුගේ මිත්තණියයි.
(3) මහමෙව්නා උයන පිදූ තැනැත්තියයි. (4) මුටසීව රජුගේ බිසවයි.

35. ධර්මාශෝක අධිරාජයාත් මහානාම නම් ශාක්‍ය රජතුමාත් ලක්දිව ඉපිද පැවිදි වී රහත් වූ බව දැක්වෙන පාලි ග්‍රන්ථය තෝරන්න.
(1) ලෝකප්පදීපකසාර (2) රසවාහිනී (3) සාසනවංසදීප (4) සීහළවත්ථුප්පකරණ

36. වත්තක්ඛන්ධකයට අනුව විහාරය පිරිසිදු කරන තැනැත්තා විසින් පළමුව කළ යුතු වන්නේ,
(1) කැලි කසල බැහැර කොට හැමදීමයි.
(2) දොර ජනෙල් විවෘත කර ආලෝකය ලබා ගැනීමයි.
(3) පා සිවුරු බැහැර කොට එක් පැත්තක තැබීමයි.
(4) මකුළු දැල් හා දූවිලි ක්‍රමයෙන් ඉවත් කිරීමයි.

37. 'සද්ධිවිහාරිකො .......... පරිපුච්ඡිතබ්බො' මෙහි හිස්තැනට ව්‍යාකරණානුකූලව ගැළපෙන පදය කුමක් ද?
(1) පානීයං (2) පානීයෙන (3) පානීයස්ස (4) පානීයෙසු

38. දෙවනපෑතිස් රජු අශෝක රජු හමුවීමට යැවූ දූතයන් අතර ප්‍රධානියා වූයේ,
(1) අරිට්ඨ ඇමතියා ය. (2) උපතිස්ස නම් පුරෝහිතයෙකි.
(3) ගණකයෙකි. (4) නම නොදැක්වෙන අමාත්‍යයෙකි.

39. ධම්මපදයේ පණ්ඩිත වර්ගය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශයක් වන්නේ මේවායින් කුමක් ද?
(1) පණ්ඩිත වර්ගයේ ඇතුළත් ගාථා සංඛ්‍යාව දාහතරකි.
(2) පාද හතරකින් යුක්ත වන ගාථා පමණක් එහි ඇතුළත් වේ.
(3) න අත්තහෙතු න පරස්සහෙතු ....... යනාදි ගාථාව මෙහි ඇතුළත් වන්නකි.
(4) පණ්ඩිත යන පදය රහතන් වහන්සේට ද පර්යාය නාමයක් ලෙස යෙදී ඇත.

40. ලක්දිව පළමුව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා ප්‍රධාන අනුග්‍රහය දක්වන ලද්දේ
(1) පොදු මහජනතාව විසිනි. (2) ප්‍රාදේශීය ජනප්‍රධානියෙකු විසිනි.
(3) බුවනෙකබාහු රජු විසිනි. (4) වලගම්බා රජු විසිනි.

41. දෙවනපෑතිස් රජුගේ බාල සොහොයුරු වූ තෙරුන් වහන්සේගේ නම කුමක් ද?
(1) චූලාභය තෙරුන් (2) තිස්සදත්ත තෙරුන්
(3) මත්තාභය තෙරුන් (4) මහාරිට්ඨ තෙරුන්

42. අවස්ථා නිරූපණයක් සහිත කාව්‍යාත්මක පාලි පාඨය තෝරන්න.
(1) නිබ්බින්දිය තතො රූපෙ ඛන්ධානං උදයබ්බයං
(2) මන්දං උත්තානසයනං පිසාචිභයතජ්ජිතා
(3) වක්කලී නාම නාමෙන හෙස්සති සත්ථුසාසනෙ
(4) වදනෙන සුගන්ධෙන මධුරෙන රුතෙන ච

43. වත්තක්ඛන්ධකයට අනුව නිවැරදිව සිවුර හැකිළිය යුතු ආකාරය ප්‍රකාශ වන වරණය තෝරන්න.
(1) චීවරයෙහි කෙළවර අඟල් හතරක් උඩට ඇද හැකිළිය යුතුය.
(2) චීවරය සමඟ අඳනය එකට කොට සතරට නැමිය යුතුය.
(3) සිවුර හා අඳනය එකට තබා කායබන්ධනයෙන් වෙලිය යුතුය.
(4) සිවුරෙහි සතර කොණ සමාන්තරව ගෙන හැකිළිය යුතුය.



0006965

**44.** **'පුබ්බයොගො බාහුසච්චං - දෙසභාසා ච ආගමො'** යන්නෙහි **දෙසභාසා** යනු විශේෂයෙන්

(1) ප්‍රාදේශීය ව්‍යවහාර කුශලතාවයි.
(2) මාගධ භාෂාවෙහි දක්ෂ බවයි.
(3) විදේශීය භාෂාවන් දැනගැනීමයි.
(4) ස්වදේශ භාෂා කෞශල්‍යයයි.

**45.** 'සිගාල සූත්‍රය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් සහිත වරණය තෝරන්න.

(1) දීඝනිකායේ මහාවග්ගයට අයත් අටවන සූත්‍රයයි.
(2) දේශනාව අවසානයේ සිගාල ගෘහපතියා තිසරණ ගොස් පැවිදි විය.
(3) බුදුරදුන් රජගහනුවර වේළුවනාරාමයේ වෙසෙන කල්හි සිදුවූ පුවතක් මෙහි ඇතුළත්ය.
(4) විවිධ සමාජ යුතුකම් හා වගකීම් පිළිබඳ බෞද්ධ අදහස පමණක් මෙහි දක්නට ලැබේ.

**46.** දෙවන හා තෙවන ධර්ම සංගායනාවන් සඳහා අනුග්‍රහය දැක්වූ රජවරුන් අනුපිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

(1) කාළාශෝක, ධර්මාශෝක
(2) අජාතසත්තු, ධර්මාශෝක
(3) ධර්මාශෝක, කාළාශෝක
(4) කණිෂ්ක, ධර්මාශෝක

**47.** මහින්දාගමනයෙන් ඉක්බිතිව දඹදිවින් මෙරටට පැමිණි මහතෙරවරුන් හා අලුත පැවිදි වූ භික්ෂූන් ප්‍රථම වරට වස් එළඹියේ කුමන ස්ථානයක ද?

(1) මිහින්තලේ කණ්ටක සෑය හාත්පස
(2) ථූපාරාම චෛත්‍ය ඉදිකිරීමට නියමිත තැන
(3) මහා විහාරය ඉදිකෙරෙන ස්ථානය
(4) කාලප්‍රාසාදය නම් තාවකාලික ගොඩනැගිල්ල තුළ

**48.** මහාසුපින ජාතකය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය මෙවායින් කවරක් ද?

(1) කොසොල් රජු අවදි වූ විගස බුදුරදුන් හමුවීමට ගොස් සියල්ල පැවසීය.
(2) කොසොල් රජු සවස් කාලයේ පැමිණි බමුණන්ට යාගයක් කරන ලෙස ඉල්ලීය.
(3) කොසොල් රජු සොළොස් සිහින දැක බියට පත්ව පළමුව බිසවට කීවේය.
(4) සිහින දුටු රජතුමා මරණ බියෙන් තැතිගෙන ඇඳ මත හිඳිමින් කල් ගෙවීය.

**49.** නො දැහැමි රජවරුන්ගේ පාලන කාලයන්හි විය හැකි සිදුවීමක් ලෙස මහාසුපින ජාතකයෙහි සඳහන් **නොවන** කරුණ තෝරන්න.

(1) ලොල් විනිසුරුවන් දෙපාර්ශවයෙන් අල්ලස් ගෙන සම්පත් භුක්ති විඳීම.
(2) වියපත් පුද්ගලයන් පිළිසරණක් නොමැතිව දරුවන් සතුටු කොට දෙන ලද දෙයින් තෘප්තිමත් වීම.
(3) ඒකරාශී වූ වැසියන් රජුට එරෙහිව උද්ඝෝෂණය කොට බත් වැටුප් ඉල්ලීම.
(4) දිළිඳු මිනිසුන් හිස් වූ තම අටුකොටු දෙසවත් නොබලා රජුගේ අටුකොටු පිරවීම.

**50.** වක්කලිත්ථේරාපදානයෙන් ගතහැකි ජීවිතාදර්ශ අතර වඩාත් වැදගත් ආදර්ශය වන්නේ,

(1) සංසාරික ප්‍රාර්ථනාවන්හි බලවත් බව තේරුම් ගැනීම ය.
(2) පින්කම් කිරීමෙන් අගතනතුරු ප්‍රාර්ථනා කළ යුතු බව ය.
(3) සියලු පූජාවන් අතර බුද්ධපූජාව ම බලවත් වන බව ය.
(4) 'සද්ධාධිමුත්ත' ශ්‍රාවකයෙකු වීම ඉතා දුෂ්කරය යන්න ය.

* * *

PAST PAPERS WIKI

AL/2023(2024)/74/STE-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

පාලි II
பாளி II
Pali II

74 STE II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

வினாத்தாளை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.

**උපදෙස්:**

* I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, II හා III කොටස්වලින් **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සම්පූර්ණයෙන් **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතු ය.

## I කොටස

1. සිංහලට නගන්න.

(i) සචෙ පිණ්ඩපාතො හොති, සද්ධිවිහාරිකො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. සද්ධිවිහාරිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ සද්ධිවිහාරිකො නහායිතුකාමො හොති, නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති, උණ්හං පටියාදෙතබ්බං.

(චුල්ලවග්ගපාළි)

(ii) න අත්තහෙතු න පරස්ස හෙතු, න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො, ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.

අප්පකා තෙ මනුස්සෙසු, යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා, තීරමෙවානුධාවති.

යෙ ච ඛො සම්මදක්ඛාතෙ, ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති, මච්චුධෙය්‍යං සුදුත්තරං.

කණ්හං ධම්මං විප්පහාය, සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම, විවෙකෙ යත්ථ දූරමං.

තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය, හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං, චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

(ධම්මපදපාළි)

(ලකුණු 10 + 10 = 20)

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

03030000188110130

2. (i) **සිංහලට** නගන්න.

තං දිවසඤ්ඤෙව බොධිසත්තොපි තං කාරණං ඤත්වා අජ්ජ මයි මනුස්සපථං ගතෙ මහාජනස්ස බන්ධනා මොක්ඛො භවිස්සතීති ආකාසෙන ගන්ත්වා උය්‍යානෙ ඔතරිත්වා සුවණ්ණපටිමා විය මඞ්ගලසිලාතලෙ නිසීදි. මාණවො බොධිසත්තං උපසඞ්කමිත්වා වන්දිත්වා එකමන්තං නිසීදිත්වා පටිසන්ථාරං අකාසි. බොධිසත්තොපි තෙන සද්ධිං මධුරපටිසන්ථාරං කත්වා කින්නුඛො මාණව, රාජා ධම්මෙන රජ්ජං කාරෙතීති පුච්ඡි. භන්තෙ, රාජා නාම ධම්මිකො, අපි ච ඛො තං බ්‍රාහ්මණා අතිත්ථෙ පක්ඛන්දාපෙන්ති. රාජා සොළසසුපිනෙ දිස්වා බ්‍රාහ්මණානං ආරොචෙසි. බ්‍රාහ්මණා යඤ්ඤං යජිස්සාමාති ආරද්ධා, කින්නුඛො භන්තෙ, අයං නාම ඉමෙසං සුපිනානං නිප්ඵත්තීති රාජානං සඤ්ඤාපෙත්වා තුම්හාකං මහාජනං භයා මොචෙතුං න වට්ටතීති? මයං ඛො මාණව, රාජානං න ජානාම, රාජාපි අම්හෙ න ජානාති. සචෙ පන ඉධාගන්ත්වා පුච්ඡෙය්‍ය, කථෙය්‍යාමස්ස මයන්ති. මාණවො අහං භන්තෙ, ආනෙස්සාමි. තුම්හෙ මමාගමනං උදික්ඛන්තා මුහුත්තං නිසීදථාති බොධිසත්තං පටිජානාපෙත්වා රඤ්ඤො සන්තිකං ගන්ත්වා මහාරාජ, එකො ආකාසචාරිකො තාපසො තුම්හාකං උය්‍යානෙ ඔතරිත්වා තුම්හෙහි දිට්ඨසුපිනානං නිප්ඵත්තිං කථෙස්සාමීති තුම්හෙ පක්කොසතීති ආහ.

(ජාතකට්ඨකථා)

(ii) **පාලියට** නගන්න.

(අ) භික්ෂූහු තථාගතයන් වහන්සේගේ ධර්මය මනාව ඇසූහ.

(ආ) අපි ගඟ බලමින් ඉවුරේ ඇවිදින්නෙමු.

(ඉ) නුඹලාගේ විහාරයෙහි කුඩා චෛත්‍යයක් තිබේ.

(ඊ) දුටුගැමුණු රජු විසිහතර අවුරුද්දක් රාජ්‍ය කළේය.

(උ) පවුකාරයා පුත්‍රයන් ලවා පක්ෂීන් මරවයි.

(ලකුණු 10 + 10 = 20)

## II කොටස

3. (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සිගාලකං ගහපතිපුත්තං කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං. දිස්වා සිගාලකං ගහපතිපුත්තං එතදවොච; කින්නුඛො ත්වං ගහපතිපුත්ත. කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති? "පිතා මං භන්තෙ, කාලං කරොන්තො එවං අවච; 'දිසා තාත, නමස්සෙය්‍යාසී'ති. සො ඛො අහං භන්තෙ, පිතුවචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සාමි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති."

(අ) මෙහි කියැවෙන චරිත සංඛ්‍යාව කෙතෙක් ද?

(ආ) බුදුරදුන් හමුවන අවස්ථාවේ සිගාල ගෘහපතියා කෙසේ කුමක් කරමින් සිටියේ දැයි දක්වන්න.

(ඉ) මෙහි සඳහන් පරිදි පියා විසින් දෙන ලද උපදේශයත්, පුත්‍රයා විසින් එය පිළිපැදීමට හේතුවත් පෙන්වා දෙන්න.

(ඊ) ඡේදයෙහි දැක්වෙන සදිසා පිළිබඳ බෞද්ධ අර්ථකථනය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(ii) නිර්දිෂ්ට ග්‍රන්ථාගත පහත එක් එක් වාක්‍යයේ හිස්තැනට අදාළ වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

**(එසාහං, ඨානෙහි, පරම්මරණා, භණමානස්ස, පුරත්ථිමා)**

(අ) සො කායස්සභෙදා ..................... සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

(ආ) න උපජ්ඣායස්ස ..................... අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා.

(ඉ) ..................... භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි.

(ඊ) කතමෙහි චතුහි ..................... පාපකම්මං කරොති?

(උ) සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, ..................... වාතපානා ථකෙතබ්බා.

(ලකුණු 10 + 10 = 20)

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

(i) 'මාගධ භාෂාව ලෝකවාසීන්ගේ මුල් බස ය' යන අට්ඨකථාගත මතයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත්ව ඇති අදහස් සමාලෝචනය කරන්න.

(ii) පහත වගුවෙහි A කාණ්ඩයේ කරුණුවලට අදාළ ග්‍රන්ථය B කොටසින් තෝරා නිවැරදිව ගළපා තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන්න.

| A | B |
|---|---|
| (අ) රසවාහිනී නම් පාලි ග්‍රන්ථයට මූලාශ්‍රය වූවකි. | මහාබොධිවංසය |
| (ආ) ගාථා 415ක් ඇති පාලි පද්‍යමය කෘතියකි. | සාසනවංසදීපිකාව |
| (ඉ) සාරත්ථදීපිකා නම් අපර නාමයකින් හැඳින්වෙන්නකි. | සහස්සවත්ථුප්පකරණය |
| (ඊ) දාඨානාග තෙරුන්ගේ ආරාධනයෙන් කළ ග්‍රන්ථයකි. | දාඨාවංසය |
| (උ) බුරුම බසින් තිබී පාලියට නගන ලද්දකි. | රසවාහිනීටීකාව |

(iii) බුද්ධ පරිනිර්වාණයේ සිට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා ධර්ම-විනය රැකගත් ආචාර්ය පරම්පරා පිළිබඳව කෙටි සමාලෝචනයක් කරන්න.

(iv) පහත දැක්වෙන ග්‍රන්ථයන්ගෙන් **දෙකක** ඓතිහාසික අගය පෙන්වා දෙන්න.

(අ) මහාවග්ගපාළි

(ආ) කථාවත්ථුප්පකරණ

(ඉ) කල්‍යාණීසිලාලිපි

(ඊ) මහාකස්සපචරිත

(ලකුණු 5 + 5 + 5 + 5=20)

5. (i) පහත වගුවෙහි A කොටසේ දැක්වෙන කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ වන පාලි පාඨයක් B කොටසින් තෝරා ලියන්න.

| A | B |
|---|---|
| (අ) රූපකාලංකාර දෙකකි. | නානා ච නානා වණ්ණා ච සජීවා විය දිස්සරෙ |
| (ආ) ධර්මරසය දනවන්නකි. | මුත්තා සමුද්දා උග්ගන්ත්වා තීරෙ වට්ටි වියට්ඨිතා |
| (ඉ) ශබ්දරසය උපදවන්නකි. | සන්තවෙසො ගුණනිධි කරුණාමතිසාගරො |
| (ඊ) අවස්ථා නිරූපණයකි. | නෙතා විනෙතා අනුනෙතා තාදිසො ලභතෙ යසං |
| (උ) ස්වභාවෝක්තියකි. | නිහීනසෙවී න ච වුද්ධසෙවී නිහීයරෙ කාලපක්ඛෙව චන්දො |

(ii) මහාසුපින ජාතකයෙහි සඳහන් පහත දැක්වෙන සිහින අර්ථවත්වීමට අදාළ පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(**කුම්භියා, දීපිනො, චන්දනසාරං, පොක්ඛරණිං, උදකෙ**)

(අ) එකං පඤ්චපදුමසඤ්ඡන්නං ගම්භීරං සබ්බතොතිත්ථං .................... අද්දසං.

(ආ) එකිස්සායෙව .................... පච්චමානං ඔදනං අපාකං අද්දසං.

(ඉ) සතසහස්සග්ඝණිකං .................... පූතිතක්කෙන වික්කිණන්තෙ අද්දසං.

(ඊ) තුච්ඡලාපූනි .................... සීදන්තානි අද්දසං.

(උ) එළකෙ .................... අනුබන්ධිත්වා මුරුමුරූති ඛාදන්තෙ අද්දසං.

Past Papers Wiki
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) මහාවංසයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් අරිට්ඨ අමාත්‍යයා ප්‍රමුඛ ශ්‍රී ලාංකික දූත පිරිසේ භාරත දූත මෙහෙවර අගයන්න.

(iv) වත් පිළිවෙත් ඉටුකිරීම ශීලයට අදාළ වන ආකාරය වත්තක්ඛන්ධකයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 5+5+5+5 =20)

## III කොටස

6. (i) පහත දී ඇති ගාථාවෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණානුකූල අර්ථ පෙන්වා දෙන්න.

**තාසු** එකා **ලතායට්ඨි**, රජතාභා **තහිං** ලතා,
**සුවණ්ණවණ්ණා** රුචිරා, **දිස්සන්තෙ** තා මනොරමා.

(ii) පහත සඳහන් යෙදුම් පාලියෙන් ලියන්න.

(අ) පුරුෂයෝ සිවු දෙනෙක්
(ආ) පස්වැනි රජතුමා
(ඉ) සිහින සොළොසක්
(ඊ) ලක්ෂයක් වටිනා
(උ) අනෙක් මිනිස්සු
(ඌ) සත් දිනක්
(එ) ආයුෂ්මත් ආනන්ද
(ඒ) කොහි ගියාහු ද?
(ඔ) එක් රාත්‍රියක
(ඕ) දේවියගේ අතෙහි

(iii) (අ) අජ්ජතනී පරස්සපද විභක්ති ප්‍රත්‍යමාලාව ගෙනහැර දක්වන්න.
(ආ) 'චර' ධාතුව සත්තමී ආඛ්‍යාත පරස්සපදයෙහි වරනගන්න.

(iv) පහත දැක්වෙන ව්‍යාකරණාංග නිර්වචනය කරන්න.

(අ) අත්තනොපද
(ආ) අතීත කිතක
(ඉ) අව්‍යය පද
(ඊ) ආඛ්‍යාත
(උ) තුමන්ත ක්‍රියා

(ලකුණු 5+5+5+5=20)

7. (i) පහත දැක්වෙන වචනවලට **විරුද්ධාර්ථවත්** පද එක බැගින් ලියන්න.

(අ) අනොකං
(ආ) අනුත්තමො
(ඉ) උදයං
(ඊ) නිම්මුග්ගො
(උ) දුග්ගතිං
(ඌ) දුගන්ධං
(එ) නින්දා
(ඒ) පාරතො
(ඔ) සන්තිකං
(ඕ) සුභාවිතං

(ii) පහත ගාථාවෙන් ප්‍රකාශ වන ධර්ම කරුණු **දෙකක්** පිළිබඳ කෙටියෙන් විවරණය කරන්න.

පටිසම්භිදා චතස්සො ච, විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා, කතං බුද්ධස්ස සාසනං.

(iii) මහාසුපින ජාතකාගත සිහින පිළිබඳ විවරණයෙහි සර්වකාලීන අගය නිදසුන් **පහක්වත්** ඇසුරෙන් අනාවරණය කරන්න.

(iv) ධම්මපදයේ පණ්ඩිත වග්ගයෙන් අනාවරණය කෙරෙන පණ්ඩිත ලක්ෂණ **දහයක්** ගෙනහැර දක්වන්න.

(ලකුණු 5+5+5+5 =20)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi


Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library